සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**13 ශ්‍රේණිය** | **චිත්‍ර කලාව** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (4) | 02. (2) | 03. (1) | 04. (3) | 05. (2) | 06. (4) | 07. (2) | 08. (4) | 09. (2) | 10. (1) |
| 11. (3) | 12. (3) | 13. (2) | 14. (2) | 15. (1) | 16. (1) | 17. (3) | 18. (3) | 19. (2) | 20. (2) |
| 21. (2) | 22. (3) | 23. (2) | 24. (4) | 25. (1) | 26. (4) | 27. (3) | 28. (2) | 29. (3) | 30. (2) |
| 31. (4) | 32. (2) | 33. (2) | 34. (3) | 35. (4) | 36. (3) | 37. (2) | 38. (2) | 39. (4) | 40. (3) |

(ලකුණු 40)

## I කොටස

### 'අ' කොටස

01. (1) සමාධි බුදු පිළිමය

(2) <u>අවුකන බුදු පිළිමය :</u>

- ★ කළු ගලින් පූර්ණ උණතව නෙලා ඇත.
- ★ පැවැත්මේ ආරක්ෂාව සඳහා අනුබද්ධව නෙලීම වැදගත් වේ.
- ★ මාධ්‍ය අනුව පිපිරීම් වලින් ද වැළක්විය හැකිය.

(3) <u>සමාධි පිළිමය :</u>

- ★ තොළුවිල පිළිමය ද ගුණාත්මක අගයෙන් යුතු භාව පූර්ණ පිළිම වේ.

<u>අවුකන බුදු පිළිමය :</u>

- ★ අනුරාධපුර යුගයේ බුදු පිළිම සඳහා ඉන්දීය කලාවේ ආභාෂය ලැබී ඇත.
- ★ සමාධි හා කොළුවිල පිළිම සඳහා ඉන්දීය ගුප්ත කලා ලක්ෂණ බලපා ඇත. මෙම බුදු පිළිම තුළින් බුදුන් වහන්සේගේ මහා කාරුණික ගුණය හා මහා පෞරුෂය නිරූපණය කරයි.
- ★ චීවරය තුළින් ශරීරය විනිවිද පෙන්වා ඇත, අවුකන බුදු පිළිමය අමරාවතී කලා ලක්ෂණ පිළිබිඹු කරයි.
- ★ අවුකන, සැන්සේරුව, බුදුරුවගල අමරාවතී ලක්ෂණ පෙන්වයි.
- ★ බුදුන් වහන්සේ මහා කරුණාව කළු ගලකට ආරෝපණය කර ඇත.

02. (1) වෙස්මුහුණු, ඇත් දත්, මැටි, පැදුරු, ලාක්ෂා පිත්තල

(2) ජනකලා කර්මාන්ත අතර මැටි කර්මාන්තයේදී සකපෝරුව නම් උපකරණය භාවිතා කෙරේ. මැටි කලයේ හැඩය උකුලේ රඳවා ගැනීමට හැකි අයුරින් සකසා ඇත. නැඹිලියේ ඇති දාර තුළින් ගල් ඉතිරිය පහසු කරයි.

- ★ ගොඩනැගිලි ද්‍රව්‍ය නිර්මාණයේ ද යොදාගනී.
- ★ මැටි දියර ක්‍රමයට අනුව භාණ්ඩය සකපුවරුව මත තබා කරකැවීමේදී පින්සලයෙන් වර්ණ පටි ඇඳීම කරනු ලබයි.
- ★ භාණ්ඩය වියළුණු පසු රතු වර්ණය ගෑ පටි මත මෝස්තර කැටයම් කරයි.
- ★ පිළිස්සීමෙන් පසු මේ මෝස්තර, ගුරුගල් සායම් නිසා මැටිටෙහි පැහැයට වඩා වෙනස්ව පෙනේ.

(3) උදා : වෙස් මුහුණු කලාව

- ★ ශාන්ති කර්ම හා ප්‍රසාංගික කලා සඳහා යොදාගනී.
- ★ වෙල්කඳුරු ලී භාවිතයට ගනී.
- ★ මෙම භාණ්ඩ නිෂ්පාදනය මිලට ගෙන අලෙවි කිරීමට ආයතන ඇත.
- ★ සංචාරක කර්මාන්තය නිසා වෙස්මුහුණු කලාවේ තිබූ ගුණාත්මක භාවය හීන වී ගොස් ඇත.
- ★ නිෂ්පාදනයේ දී පාරම්පරික ශිල්ප ක්‍රම මගහැරී ගොස් ඇත. එය අලෙවි කරන භාණ්ඩයක් බවට පත්විය.
- ★ අවශ්‍ය අමුද්‍රව්‍ය සපුරා ගැනීමට පහසුකම් සැලසිය යුතුය. අලෙවිය සඳහා හොඳ වෙළඳපලක් තිබිය යුතුය. පාරම්පරික ශිල්පක්‍රම රැකගැනීම පිළිබඳව ඔවුන් දැනුවත් කළ යුතුවේ.

### 'ආ' කොටස

03. (1) තාපස රුව, නලඟන රුව, කවන්ධ රුව, නර්තනය සඳහා කවන්ධ රුව

(2) මූර්ති කුඩා වුව ද නිර්මාණශිලීය. හරප්පාවෙන් හමුවූ කවන්ධ රුවේ විශේෂත්වය ශරීර අවයව වෙන වෙනම

සකසා සායම් කිරිමයි. ★ මානව දේහ විලාසය ඒ අයුරින් ම නිරූපණය කොට ඇත. ★ තාපස රුව, සෞන්දර්යාත්මක කුසලතාවය පෙන්වයි. ★ මාධ්‍ය හසුරුවා ඇති අයුරු කදිමය. තුන් මල් පෙති මෝස්තරය සහිත පොරෝණය මූර්තියට සෞන්දර්යයක් ගෙන දෙයි.

(3) ඉන්දු නිම්න වැසියන් තුළ මවු දෙවඟන පිදීම ප්‍රචලිතය.

★ දරුවන්ට කිරිපොවන ස්ත්‍රිය ★ ගර්භණී කාන්තා රූප දක්වේ.

★ යෝනියෙන් පැලයක් මතුවන මුද්‍රා ඇත ★ මව් දෙවඟන පිදීම සඳහන් වේ.

04. (1) ස්තූපය, ගල් වැට, තොරණ

(2) මහාස්ථූපය තොරණ 04 කි.

(3) මොග්ගලී පුත්ත තිස්ස තෙරුන්ගේ ධාතු තැන්පත් කළ ස්තූපය තොරණ නැත. ගල්වැට ඇත.

(4) අභය වූ ධාතු නිදන් කළ චෛත්‍ය

(5) ★ සාංචි තොරණේ කැටයම් වලට බුද්ධ චරිතයේ සිද්ධි වස්තු විෂය විය. බුදුන් රූපකායෙන් නොදැක්වූ අතර බුදුන් වෙනුවට ඡත්‍රය, බෝධිය, සිරිපතුල, වජ්‍රාසනය, ධර්ම චක්‍රය යෙදූහ.

★ අභිනිෂ්ක්‍රමණය දැක්වෙන කැටයම්, ඡත්‍රය හා සිරිපතුල, සංකේත ලෙස යොදා ඇත.

★ මාරපරාජයේ දී බුදුන් බෝධියෙන් දක්වා ඇත.

★ බෝධිය දක්වා ඇත්තේ ජටිල දමනය, සංකස්ස පුර වැඩීම, කිඹුල්වත් පුර වැඩීම ආදියෙහිය.

**'ඉ' කොටස**

05. (1) ප්‍රංශයේ ඩොර්ඩෝන් ප්‍රදේශයේ පිහිටා ඇති ලැස්කෝ ගුහාව

(2) ★ ඉතා තාත්විකව සතුන්ගේ ඉරියව් චිත්‍රණය කර ඇත.

★ එම සිතුවම් අතරින් ඊතල පහර කා බිම ඇද වැටෙන බයිසන් ගවයාගේ රුව විශේෂත්වයක් ගනී.

★ තරබාරු මීහරක් දෙදෙනකුගේ රූප ද ස්වභාවික ඉරියව් වලින් යුක්තවය. අං සහිත පිනිමුවන්ගේ දර්ශන ද ඇත.

(3) ගුහා සිතුවම් ඇඳී හේතුව නිශ්චිතව කිව නොහැකි වුවත් කිසියම් ආගමික විශ්වාසයක් අනුව සිතුවම් අඳින්නට ඇති බව සිතිය හැකිය.

★ දඩයමින් ජීවත් වූ ඔවුන්ට නිතර ඇහැ ගැටෙන සතුන් අඳින්නට ඇත.

★ සමහර සතුන් ඊ පහර කා ඇද වැටෙන අයුරු ඇඳ ඇත.

★ සතුන්ගෙන් වන්නා වූ විවිධ අනතුරු පිළිබඳව ද ඔවුන්ගේ අත්දැකීම් ඇත. ඉන් මිදීම සඳහා මෙම සිතුවම් අඳින්නට ඇත.

★ මළවුන් පිදීම, දඩයම් සාර්ථක කර ගැනීම වැනි අරමුණු ද විය.

06. (1) ස්පින්ක්ස්, රැම්සෙස්. කාෆ්රේ, තෝප්‍රෙට්, රහොටෙප්

(2) ★ සමාන්තර රේඛා අතර චිත්‍ර ඇඳීම

★ ශෛලිගත බව

★ හයිරොග්ලිෆික්ස් අක්ෂර යෙදීම / මිසර රූපාක්ෂර

★ ද්විමාන බව

★ රේඛාවට මුල් තැන දීම

★ ජ්‍යාමිතික හැඩතල භාවිතය

(3) ★ සම්ප්‍රදායට යටත්ව මූර්ති, කැටයම්. චිත්‍ර නිමකොට ඇත.

★ සාම්ප්‍රදායික බවින් මිදුණු යුගය ස්වර්ණ යුගය හෙවත් නව රාජධානි යුගයකි.

★ මෙය අතිනේටන් රාජ්‍ය සමයයි.

★ ස්වාභාවිකත්වයට නැඹුරු වූ මූර්ති නිම කළහ. නෙෆර්ටිටි, අකිනේටන් හා හෙපර්ටිටි, ස්ක්‍රයිබ් හෙවත් ලියන්නා උදාහරණයකි.